Department of Education,Sabaragamuwa Province/ Weekly School

- දුවේ පුතේ”
- ඔබේ නිවසේ අය හා එක්ව මෙම දෙබස වින්දනාත්මකව රඟ දක්වමින් කරන්න.
- **මල හා සමනලයා**

**ළමයා :** සමනලයෝ . . . //

**සමනලයා :** ඇයි ළමයෝ . . . //

**ළමයා :** කොහේද ඔබ ඉගිළෙන්නේ

**සමනලයා :** පැණි සොයමින් ඉගිළෙන්නේ

**ළමයා :** අපේ ගෙදර මල් වත්තේ - මල් පිපිලා හැම පැත්තේ

**සමනලයා :** එහෙනම් මට මල් වත්තට - යන්නට අවසර දෙන්නේ

**ළමයා :** ඕක අහන්නත් දෙයක් ද ? - මල් හැමට ම අයිති නේ ද ?

**සමනලයා :** ඔයා වගේ පුංචි ළමයි - හැමදෙනාට කරුණාව යි

- **වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැනට ලියන්න.**

1. මෙම දෙබස පවසන්නේ . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   (ළමයා සහ සමනලයා/ළමයා සහ මීමැස්සා)
2. සමනලයා ඉගිළෙන්නේ . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   (ගෙදර යන්න/පැණි සොයන්න)
3. මල් පිපිලා තිබෙන්නේ . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   (මල් වත්තේ/පාසල් වත්තේ)
4. ළමයා මල් පැණි බීමට . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   (අවසර දුන්නේ නැහැ/අවසර දුන්නා)
5. පුංචි ළමයි හැම දෙනාට . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   (කරුණාව යි/අකීකරු යි)